# පෘතුගීසි හා ඕලන්ද පාලන සමයේ ලාංකික දෙමළ ජනතාවගේ ක්‍රියාකාරීත්වය

හල්පිටියේ සමිතසිරි හිමි

ක්‍රි.ව. 1619 වසරේ දී එවකට යාපනය ප්‍රාදේශීය බලවතා බවට පත් ව සිටි II වැනි සංකිලි පාරජය කළ පෘතුගීසි සේනා එහි බලය තහවුරු කර ගත්හ. ඒ වන විටත් යාපනය ප්‍රාදේශීයේ ජන සංයුතිය සකස් වී තිබුණේ සිංහලයන්ගෙන්, ආර්යචක්‍රවර්ති පරපුරට අයත් වූ පිරිසකගෙන් සහ වරින් වර චක්‍රවර්තීවරුන් තම ආරක්ෂාවට ගෙන ආ දෙමළ, කේරළ සහ වඩුග පිරිස් වලිනි. ආර්යචක්‍රවර්තී පරපුරට අයත් බොහෝ දෙනෙක් පෘතුගීසීන් විසින් ගෝවට පිටත් කරන ලද හ. ඉතිරි වූවන් පෘතුගීසින් විසින් කතොලිකයන් බවට පත් කරවා මුදලිකම් ප්‍රදානය කරන ලදි.

යාපනය පෘතුගීසින්ට නතු වීම නොඉවසූ එහි සිටි සිංහලයෝ කැරැල්ලක් ඇති කළහ. මීගපුල්ලලේ ආරච්චි නමැත්තකු ගේ නායකත්වයෙන්, ඒ වන විට යාපනයේ සිටි සෙසු ජන කොටස්වල ද සහය ලබාගත් සිංහලයෝ ක්‍රි.ව 1620 දී යාපනයේ පෘතුගීසි නායකයා වූ පිලිප්පු ඩී. ඔලිවේරා සිය අත්අඩංගුවට ගත්හ. ඔලිවේරා අත්අඩංගුවට ගැනීමෙන් පසු අරගලය තාවකාලිකව නැවතූ සිංහලයෝ වැඩි දුර කටයුතු සඳහා උඩරට රජුගෙන් ආධාර පැතූහ. ඒ අතර ම දකුණු ඉන්දියාවෙන් පෘතුගීසින්ට එරෙහි සටනට ආධාර ලෙස කුලී හමුදාවක් ලබා ගැනීමටද උත්සහ දැරූහ. එහෙත්, සිද්ධියේ බරපතලකම ගැන වටහාගත් එවකට ලංකාවේ පෘතුගීසි කපිතාන් ජෙනරාල් කුන්ස්තන්තීනු ද සා වහා හමුදාවක් යවා කැරැල්ල මැඩ පැවැත්වීය.

මෙයට පසු ඒ වසරේ ම අග භාගයේදී තන්ජෝරයේ නායක් පාලකයා වඩුග භටයන් දෙදහසක සේනාවක් යාපනයට එවුවද ඒ පිළිබඳ ආරංචිය කල් වේලා ඇතිව ලැබීම නිසා වඩුගයන් පරාජයට පත් කිරීමට පෘතුගීසීන්හු සමත් වූහ. 1621 වසරේ දී යාපනයේ පාලනය හිමි කර ගැනීම සඳහා වන ගිවිසුමකට පෘතුගීසීහු අත්සන් කළහ. ඒ ගිවිසුම පවා ලියවී ඇත්තේ සිංහල හා පෘතුගීසි භාෂා වලිනි.[1]

උඩරට සිංහල රජු යාපනය තමාට අයිති ප්‍රදේශයක් ලෙස දිගින් දිගටම සැලකූ බවත් පෙනෙන්නට ඇත. පෘතුගීසීන් තමන්ගේ ප්‍රදේශයක් බලහත්කාරයෙන් පාලනය කළ බව උඩරට රජුගේ අදහස විය. මේ අනුව යාපනය සියතට ගැනීම සඳහා 1629 වසරේ දී සෙනරත් රජු අතපත්තු මුදලාලි යටතේ තුන්දහසක සිංහල සේනාවක් යාපනයට යැවීය.[2] කෙසේ වෙතත් පෘතුගීසීන්ට කොළඹින් ලැබුණු සහය නිසා අතපත්තු මුදලාලිගේ සේනාව පරාජයට පත් විය. මේ ප්‍රහාරයත් සමඟම පෘතුගීසීන් යාපනය තමන්ට කොයි මොහොතේ හෝ අහිමි වෙතැයි බියකින් කටයුතු කරන්නට වූ බව පෙනී යයි. රන්දෙණිවෙල දී සිංහලයන් අතින් පෘතුගීසි හමුදා සමූල ඝාතනය වීමත් සමඟ යාපනයට, තිරිකුණාමලයට සහ මඩකලපුවට සිංහලයන් පහර දෙනු ඇතැයි බලාපොරොත්තුවෙන් දකුණු ඉන්දියාවේ නාගපට්ටනමේ සිට පෘතුගීසි සේනා වහාම පැමිණිය හ. අභ්‍යන්තර ප්‍රශ්න නිසා සිංහලයන්ට තනිවම යාපනයෙන් පෘතුගීසින් පලවා හැරීමට නොහැකි විය. 1621 දී යාපනයේ පාලන බලය සියතට ගත් පෘතුගීසීන්ට එය අහිමි වන්නේ 1658 ජූනි මාසයේ දී ය. සිංහල රජුගේ අනුමැතිය ඇතිව ලන්දේසීහු ඒ කටයුතු සිදු කළ හ.

යාපන ප්‍රදේශය පෘතුගීසි පාලන බලය නතුව තිබූ කාලයේ එහි ජන සංයුතියේ ප්‍රබල වෙනසක් සිදු වූ බවට සාධක නැත. යාපනය තමන්ට හිමි වීමට පෙර, 1560 වසරේ දී කතෝලික ආගම වැලඳගත් දෙමළ පරවර්වරුන් යාපනයේ පදිංචි කරවීමට පෘතුගීසීන් උත්සහ දැරුව ද එය අසාර්ථක විය. එයට පෙර කතෝලික දෙමළ පරවර්වරුන් පිරිසක් පෘතුගීසී අනුදැනුම පිට



16 OCT 2017

කතෝලික දෙමළ පරවර්වරුන් පිරිසක් පෘතුගීසී අනුදැනුම පිට මන්නාරම ප්‍රදේශයේ පදිංචි කරවුවද සංකිලි 1544 වසරේ දී ඔවුන් සමූල ඝාතනයය කළේය. 1621 -1658 කාල සීමාවේ දී දකුණු ඉන්දීය ජන කොටසක් යාපනයට හෝ රටේ වෙනත් තැනකට හෝ පෘතුගීසින් විසින් ගෙන එන ලද බවට සාධක නැත. මේ හේතුවෙන් යාපනය ලන්දේසි පාලනයට නතු වන විටත් එහි සිටියෝ සිංහලයෝ, ආර්යචක්‍රවර්ති, පවුලේ ඉතිරි වුවන්ගෙන් පැවත එන්නෝ සහ දෙමළ - කෝරළ- වඩුග කුලී හමුදා සමඟ පැමිණ යාපනයේ රැඳී සිටි සුළු පිරිසකි. මේ සියලු කොටස් එකතු කළ ද ඉතා විශාල ජනගහනයක් යාපනයේ නොවීය. 1674 වසරේ දී ගෝවට යැවූ වාර්තාව අනුව යාපනයේ පදිංචි ව සිටි පිරිස ද ප්‍රදේශය අත්හැර යමින් සිටියහ. එයට ප්‍රධාන හේතුව පෘතුගීසි නිලධාරීන් ගේ වරද බව එහි දක්වේ. පෘතුගීසි ප්‍රධානියෙකු මෙසේ දක්වන්නට ඇත්තේ යාපනයේ සිටි සිංහලයන් වන්නිය හරහා උඩරට රජුගේ පාලන ප්‍රදේශවලට යාමත් විය යුතුය. එනම්, ඒ වන විටත් දෙමළ - වඩුග- කේරළ පිරිස් තම මුල් බිම ලෙස සකසා ඇත්තේ දකුණු ඉන්දියාවයි.

පසු කාලීනව යාපනයේ බලය හිමි කරගත් ලන්දේසීන් විසින් දුම්කොළ වගා කටයුතු සඳහා දකුණු ඉන්දීය ගොවීන් යාපනයට රැගෙන ආවද පෘතුගීසින්ට එවැනි අවශ්‍යතාවක් නොවීය. පෘතුගීසි දුම්කොළ වගාව ගැන අවධානය යොමු කළ වගක් අසන්නට නැති අතර ඔවුන්ගේ ප්‍රධාන ආදායම් බෝග වූයේ කුරුඳු, ගම්මිරිස් සහ පුවක්ය. යාපන අර්ධද්වීපය හා තදාසන්න ප්‍රදේශ මේ වගා තුනටම හිතකර නොවීය. පෘතුගීසින් යාපනයේ බලය පවත්වා ගැනීමට ප්‍රධානම ආර්ථිකම හේතුව වූ යේ එහි පැවති අලි ඇතුන් වෙන්දෙසියයි. ඉතා සරු අලි ඇතුන් වෙළදාමක් යාපනයේ කෙරුණු අතර ඉන් පෘතුගීසීන්ට විශාල ආදායමක් හිමි විය. විශාල වශයෙන් මුදල් හුවමාරු වූ යාපනයේ අලි ඇතුන් වෙන්දේසියෙන් පෘතුගීසි නිළධාරීන් අයථා වාසි ලබනු ඇතැයි සිතූ පෘතුගාල බලධාරීහු මේ සඳහා යාපනයේ කපිතාන් මෙජර් නොපැමිණිය යුතු බවට නියෝග කළහ.[3] මදුරාවේ නායක්, බෙන්ගාලයේ නවාබ්, ගොල්කොණ්ඩේ ෂා සහ

විජයනගර් පාලකයන් සිය නියෝජිතයන් යාපනයේ අලි ඇතුන් වෙන්දේසියට එවා අලි ඇතුන් මිල දී ගෙන ඇත. මෙයට අමතරව 1630 න් පසු පෘතුගාල යටත් විජිත ප්‍රදේශවල බලවත් වෙඩි බෙහෙත් හිඟයක් ඇති වූ බවත් එය මඟ හරවා ගත්තේ මදුරාවේ නායක්වරයා සමඟ ඇති වූ කරගත් ගිවිසුමකින් බවත් සඳහන්ය.[4] 1633 වසරේ දී ඇති වූ ඒ ගිවිසුම අනුව පෘතුගීසින් ලංකාවේ අලි ඇතුන් නායක් පාලකයන්ට ලබා දිය යුතු විය. ඒ වෙනුවෙන් නායක් පාලකයා පෘතුගීසින්ට වෙඩි බෙහෙත් ලබා දිය යුතු විය. නායක්වරුන්ට අමතරව බෙංගාලයේ නවාබ්වරයා සමඟ ද ලංකාවේ අලි ඇතුන් සඳහා වෙඩි බෙහෙත් හුවමාරු ගිවිසුමක් ඇති කර ගැනීමට පෘතුගීසීහු සමත් වූහ.

මේ නිසා යාපනයේ වැවිලි බෝග වගාව කෙරෙහි පෘතුගීසීන්ගේ ඒතරම් උනන්දුවක් නොවීය. අලි ඇතුන් වෙළදාම සහ වෙනත් බදු එකතු කිරීම් සඳහා ප්‍රමාණවත් පිරිසක් තමන් සතු වීම නිසා පිටතින් පිරිසක් ගෙන්වාගැනීමේ අවශ්‍යතාවක් ඔවුන්ට නොවීය. මේ අනුව යාපනයේ බලය ලන්දේසීන්ට හිමි වන කාලය එනම් ක්‍රි.ව. 17 වන සියවස මැද භාගය වන විටත් මේ රටේ දෙමළ යනුවෙන් ජන කොටසක් සිටියා නම්, ඔවුහු වෙළදාම සඳහා පැමිණි අය, යාපනයට ආර්යචක්‍රවර්තිවරුන් ගෙන ආ අය ගෙන් ඉතිරි වු සුළු පිරිසක් සහ උඩරට රජු ගේ අනුදැනුම මත ආගමික කටයුතු සිදහා එහි පැමිණි සුළු පිරිසක් පමණක් වූහ.

පෘතුගීසි නිලධාරීන් ගේ ක්‍රියා කලාපය හමුවේ පෘතුගීසි පාලන ප්‍රදේශවලින් ජනතාව පලා ගියේ යාපනයේ දී පමණක් නොවේ. රටේ බටහිර වෙරළබඩ තීරයේ ද එය සිදු විය. යාපනයේ ජනතාව සිටීම හෝ නොසිටීම හෝ පෘතුගීසීන්ට එතරම් ප්‍රශ්නයක් නොවුවද රටේ බටහිර ප්‍රදේශය අරබයා එය එසේ නොවීය. විශේෂයෙන් වී ගොවිතැන් කළ සිංහල ජනතාව තම ගම්බිම් අත්හැර උඩරට ප්‍රදේශවලට සංක්‍රමණය වීම නිසා පෘතුගීසීන්ට සිය ආහාරය සඳහා වත් ප්‍රමාණවත් තරම් හාල් තොග ලබාගත නොහැකි විය. එය කොතරම් දරුණු ප්‍රශ්නයක් වීද යත්, පෘතුගීසි සෙබළුන්ගේ ආහාරය සඳහා ක්‍රි.ව. 1616 වසරේ



දී හාල් තොගයක් ඉන්දියාවේ සිට කොළඹට ගෙන්වාගෙන ඇත. ලංකාවේ පෘතුගීසි කපිතාන් ජනරාල් ගේ ඉල්ලීම පිට තමා ඒ ආකාරයට හාල් යැවූ බව ඉන්දියාවේ පෘතුගීසි ප්‍රධානයකු පෘතුගාලයට යැවූ ලිපියක සඳහන් වේ.[5] 1617 වසරේ දී සෙංකඩගල සෙනරත් රජු සමඟ පෘතුගීසීන් ඇති කරගත් ගිවිසුමේ එක් කොන්දේසියක් වන්නේ ද උඩරටට පලා ආ වැසියන් නැවතත් මුල් පදිංචි ප්‍රදේශය කරා එවිය යුතු බවය.

කෙසේ වෙතත් ඒ උත්සාහය ද සාර්ථක නොවූ හෙයින් පෘතුගීසීන් ගේ සැලසුම වූයේ දකුණු ඉන්දියාවේ කොරමැණ්ඩල් වෙරළින් සහ ගෝවා ප්‍රදේශයෙන් වගා ශ්‍රමිකයන් පිරිසක් මෙරටට රැගෙන විත් මුතුරාජවෙල අස්වැද්දීමයි. එය අත්හදා බැලීමට 'කොන්කනීන්' නම් ජන කොටසක කිහිප දෙනකු මෙරටට ගෙන්වුද ටික කලකට පසු ඔවුන් නැවතත් ඉන්දියාවට යෑම නිසා උත්සාහය අසාර්ථක විය. ඉන්පසු අප්‍රිකාවේ මොසැම්බික් ප්‍රදේශයෙන් කාපිරින් දෙදහසක් ගෙන්වීමට සැලසුම් සකස් විය. එහෙත් එයද ක්‍රියාත්මක නොවීය. 1640 වසරේ ඉදිරිපත් වූ තවත් යෝජනාවකින් කියැවුණේ ගෝව ප්‍රදේශයෙන් 'කුරුම්බී' ගොවීන් මෙහි රැගෙන ආයුතු බවත් පෙර අවස්ථාවේ මෙන් ඒ පිරිස් තම මව් රටට යෑම වැළැක්වීමට වගා ඉඩම් ඔවුන්ගේ නමට ලියා දී, සියලු බඩු වලින් නිදහස් කර, හරකාබානද, ගොවි උපකරණද නොමිලේ සැපයිය යුතු බවයි. මේ කාලයේ ලන්දේසි බලපෑම් උත්සන්න වෙමින් පැවති නිසා ඒ යෝජනාව ක්‍රියාත්මක නොවීය.

මේ සිද්ධියෙන් පැහැදිලි වන්නේ ඉන්දීය කුලී ශ්‍රමිකයින් තම මව්බිම අත්හැර ලංකාවේ පදිංචියට පැමිණීමට තිබූ අකමැත්තයි. මේ අභියෝගය ජය ගැනීමට පසු කාලීනව ලන්දේසීහු සමත් වූහ. යාපන ප්‍රදේශයේ දුම්කොළ වගා කිරීම සඳහා ගෙන ආ දකුණු ඉන්දීය ශ්‍රමිකයන් එහි රඳවා ගැනීමට ලන්දේසීන්ට හැකි විය. ඒ පෘතුගීසීන් 'කුරුම්බීන්' මුතුරාජවෙල රඳවා ගැනීම සඳහා ඉදිරිපත් කළ යෝජනා යාපනයේදී ක්‍රියාත්මක කර වීමෙනි. යම් හෙයින් පෘතුගීසි යෝජනා ක්‍රියාත්මක වී නම් අද යාපන ප්‍රදේශයේ දෙමළ ජනතාව සිටින ආකාරයට මුතුරාජවෙල

ප්‍රදේශයේ කුරුම්බීන් හෝ මොසැම්බික් කාපිරියන් හෝ අපට දක ගත හැකි වනු ඇත. ඒ සඳහා යාපනයේ දෙමළ ජනතාවට ලබා දුන් ආකාරයේ අනුග්‍රහයක් කුරුම්බීන්ට හෝ කාපිරියන්ට හෝ ලැබීම ද අත්‍යවශ්‍ය සාධකයකි.

ඉන්දියානු සාගරයේ යාත්‍රා කිරීම පිළිබඳ යුරෝපීය දැනුම ආරම්භයේදී පෘතුගීසින්ට පමණක් සීමා විය. එහෙත් පෘතුගාලයේ වසර 4 ක් සහ ගෝවේ වසර 5 ක් කල් ගෙවූ 'ලින්ෂෝටන්' නම් ලන්දේසි ජාතිකයා හරහා ඒ දැනුම ඕලන්දයට ලැබීමත් සමග ලන්දේසීහු ද ඉන්දීය සාගරය ට පිවිසුණහ. 1602 දී පිහිට වූ ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම හරහා ඒ කටයුතු සිදු විය. පෙර රජවරුන් අනුව යමින් රට එක්සේසත් කිරීමේ අවශ්‍යතාවක් උඩරට සිංහල රජවරුන් ට ද තිබීණ. එහෙත් ඒ සඳහා බාධාව වූයේ පෘතුගීසීන් ගේ නාවික බලයයි. එය යටපත් කිරීමට එවැනිම නාවික බලයක් තිබූ ලන්දේසීන්ගේ සහය ලබා ගැනීම ඔවුන්ගේ අභිප්‍රාය විය. සෙනරත් රජු (1604 -1635) ඒ සඳහා 1630 පමණ සිට උත්සාහ දැරුවද එය මල්ඵල ගැන්වුණේ 1637 දීය. එවකට උඩරට පාලකයා වූයේ II වන රාජසිංහ රජුය. (1635-1675) 1637 දී ගෝව අසල මුහුදේ දී නැවක සිදු වූ සාකච්ඡාවක් අනුව සිංහල - ලන්දේසි ඒකාබද්ධ මෙහෙයුමකින් පෘතුගීසින් පරාජය කිරීමට තීරණය විය. ඒ අනුව 1639 මැයි මාසයේ II වන රාජසිංහ රජු පහළොස් දහසක සිංහල සේනාවක් මඩකලපුවට පිටත් කර හැරීයේය. එයට සමගාමීව ඇඩම් වෙස්ටවොල්ට් සෙනෙවියා යටතේ ලන්දේසි නැව් කිහිපයක් මඩකලපුවට පැමිණියේය. නැගෙනහිර වෙරළේ මඩකලපුව 1638 මැයි මාසයේ දීත්, තිරිකුණාමලය 1639 මැයි මාසයේ දීත් පෘතුගීසීන්ට අහිමි විය. මේ පරාජයන් ගැන දැනගත් පෘතුගාල රජු ගෝවේ ප්‍රධානියාට දන්වා එවූයේ පෙරදිග කලාපයේ පෘතුගීසින් සතු වැදගත්ම භූමිය වනාහි ලංකාවේ ඔවුන්ට හිමි වූ ප්‍රදේශ බවත් කවර හෝ පරිශ්‍රමයක් දරා ඒවා රැකගත යුතු බවත්ය.

1641 වසරේ දී පෘතුගාලය සහ ඕලන්දය අතර ඇති වූ ගිවිසුම අනුව සටන් නතර වූවද 1643 පමණ වන විට නැවතත් සටන් ඇරඹිණි. උඩරට හමුදාවේ ද සහය ලැබූ ලන්දේසීහු පෘතුගීසීන්ට එරෙහිව සටන් කළහ. පෘතුගීසි බලකොටු එකින් එක බිඳ වැටිණ. එහි අවසානය සටහන් වන්නේ 1656 මැයි මාසයේ කොළඹ කොටුවත්, 1658 පෙබරවාරි මාසයේ මන්නාරමත්, 1658 ජූනි මාසයේ යාපනයත් පෘතුගීසීන්ට අහිමි වීමෙනි. 1638 මැයි මාසයේ දී ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමත් II වන රාජසිංහ රජුත් අතර ඇති වූ ගිවිසුම අනුව පෘතුගීසීන්ගෙන් අල්ලාගත් බලකොටු ලන්දේසින් විසින් රජුට බාර දිය යුතු විය. ඒ සඳහා යන වියදම උඩරට රජු විසින් ගෙවිය යුතු විය. එනම් ලන්දේසීන් යනු තමාට කුලී සේවය ලබා දෙන පිරිසක් ලෙස රාජසිංහ රජු සැලකීය. එහෙත් ලන්දේසීන්ගේ අරමුණ වූයේ වෙනකකි. පෘතුගීසීන්ට නතුව තිබූ ප්‍රදේශ සියතට ගැනීමත්, හැකි නම් ඒ ප්‍රදේශ තව දුරටත් පුළුල් කර ගැනීමත්, ලන්දේසීන්ගේ අභිප්‍රාය විය. එහෙත් ඒ බව වසන් කළ ලන්දේසීහු ගිවිසුමක් මගින් උඩරට රජු රැවටූහ. 1638 ගිවිසුමේ වගන්ති වෙනස් කර, සමහර වගන්ති ඉවත් කර, තවත් සමහර වගන්ති ඉවත් කර, තවත් සමහර වගන්ති රිසිසේ අර්ථ දක්වා ලන්දේසීහු උඩරට රජු රැවටූහ. පොදු වශයෙන් බටහිරයෝ ගිවිසුම් මගින් ආසියානුවන්, අප්‍රිකානුවන් සහ ලතින් ඇමරිකානුවන් රැවටීමේ දක්ෂයෝ වූහ. මේ කාලය වන විටත් යාපනය හා මන්නාරම ප්‍රදේශවල පාලන බලය හිමි වූයේ රාජසිංහ රජුටය. භූමියේ අයිතිය හිමි වූයේ ද ඔහුටමය. II වන රාජසිංහ රජු යැවූ ලිපියක තමා යාපනයේ රජු බවත් පැහැදිලි ව දක්වා ඇත.

''මහනුවර, සීතාවක, දඹදෙණිය, අනුරාධපුර හා යාපන පටුනේ රජ වූද හලාවත, මාදම්පේ, කල්පිටිය, අරිප්පු මන්නාරම යන වරායවල හා මුතුපරවල අධිපති වූ ද රාජසිංහ වන මම......''[6]

1658 ජූනි මාසයේ පෘතුගීසීන් පලවා හැර යාපනයේ පාලනයට ලන්දේසීන් ඇඟිලි ගසන විට එහි ජීවත් වූ ජන කොටස් කිහිපයකි. ඒ සිංහලයන්, ආර්යචක්‍රවර්තී පවුලට අයත් පිරිසක් සහ කුලී සේවකයන් / හමුදාව ලෙස පැමිණ ඉතිරි වූ දෙමළ - කේරළ- වඩුග පිරිසකි.

මේ කාලය වන විට දකුණු ඉන්දියාවේ ප්‍රබල වාංශික පාලනය අවසන් ව තිබිණි. චෝළ, පාණ්ඩ්‍ය, වාංශිකයන් ගේ බලය තුරන් වී සියවස් කිහිපයක් ම ගත වී තිබිණි. විජයනගර් අධිරාජ්‍යය ද බිඳ වැටී තිබිණි. බීජාපූර් සහ ගොල්කණ්ඩ සුල්තාන්වරු පමණක් යම් පමණකට බලවත්ව සිටියහ. මයිසූරයේ රාජවාංශිකවයන් පිරිසක් ද බලය රැක ගැනීමට සමත් ව සිටියහ. ඒ හැරුණු විට දකුණු ඉන්දියා වේ බලය හිමි වූයේ මලබාර් සහ කොරමැණ්ඩල වෙරළේ විවිධ ස්ථාන කේන්ද්‍ර කරගත් පෘතුගීසී, ලන්දේසී, ප්‍රංශ, ඉංග්‍රීසි බටහිර යටත් විජිතවාදීන්ටය. ලන්දේසීන්ට ලංකාවේ ඇතැම් ප්‍රදේශවල යම් බලයක් හිමි වන 1658 පමණ කාලයේ දී දකුණු ඉන්දියාවේ සිදු වූ වැදගත් සිදු වීමක් නම් වම් ප්‍රබල සාගතයක් ඇති විමයි. මේ නිසා දකුණු ඉන්දියානුවෝ විශාල පිරිසක් දැඩි අසරණභාවයට පත් වූහ. යටත් විජිත පාලකයන් ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන දකුණු ඉන්දියානුවෝ විශාල වහල් වෙළෙඳාමකට මුල පිරූ බව පැවසේ.

පෘතුගීසීන් යාපනයෙන් ප්‍රධාන ලෙස ම ආදායම් ලැබුවේ අලි ඇතුන් වෙළෙඳාමෙන් සහ තොටුපොළ අයබදු එකතු කිරීමෙන්ය. එහෙත් ලන්දේසීන් යාපනයේ බලය හිමි කර ගන්නා කාලය වන විට අලි ඇතුන් වෙරළෙදාම පිරිහී තිබිණි. උඩරට රජු ප්‍රබල වීමත් සමඟ කප්පම් ලෙස අලි ඇතුන් ලබා දීමද නතර වූ බව පෙනේ. මේ නිසා යාපනය ප්‍රදේශයෙන් ආදායම් ඉපදීවීමට නව ක්‍රමයක් ඉක්මණින් ම හඳුන්වා දීමේ අවශ්‍යතාවක් ලන්දේසීන්ට පැන නැගිණි. ඔවුන්ගේ තෝරා ගැනීම වූයේ දුම්කොළ වගාවයි. එහෙත් දුම්කොළ වගාව සඳහා ප්‍රමාණවත් ගොවීන් පිරිසක් යාපනයේ සිටියේ නැත. ඒ අඩුව මඟ හැරීම සඳහා දකුණු ඉන්දියාවේ බටහිර වෙරළබඩ ප්‍රදේශවලින් මලබාර්වරුන් යාපනයට රැගෙන ඒමට ලන්දේසීහු ක්‍රියා කළහ. දුම්කොළ අස්වැන්න නෙළීමෙන් පසු මලබාර්වරු බොහෝ දෙනෙක් නැවතත් සිය මුල් බිම් කරා පිටත් ව ගියහ. මෙසේ තමන් රැගෙන හා පිරිස යාපනයේ දිගට ම රැඳී නොසිටීම ලන්දේසීන්ට බරපතළ ප්‍රශ්නයක් විය. මේ ගැන සොයා බලා වාර්තා කරන ලෙස ලන්දේසී ආණ්ඩුකාර කොරනේලිස් ජෝන් සයිමන් 1704



වර්ෂයේ දී එවකට යාපනය බාර ලන්දේසි නිලධාරියා වූ ක්ලාස් අයිසාක්ස්ට නියෝග කලේය. ඒ අනුව අයිසාක්ස් 1707 වසරේ දී වාර්තාවක් සැපයීය.[7] ඒ වන විට යාපනය ප්‍රදේශයේ දුම්කොළ වගාව සඳහා පැමිණි දෙමළ වෙල්ලාල වගා ශ්‍රමිකයන් අතර ඉඩම් අයිතිය, දේපළ පැවරීම, විවාහ නීති, දැවැද්ද පැවරීම වැනි කාරණ සම්බන්ධයෙන් එකඟතාවක් විය. ඒ වගා ශ්‍රමිකයන් ඒවා හැඳින්වූයේ තේස(රටේ) වලාමෙයි (නීතිය/ චාර්ත්‍රය) ලෙසය. එනම් ඔවුන් පැමිණි මලබාර් ප්‍රදේශයේ පැවති නීති සමුදායයි. එය දෙමළ වෙල්ලාල වගා ශ්‍රමිකයන්ට (තමන්ගේ) 'රටේ නීතිය' විය. අයිසාක්ස් සැපයූ වාර්තාවේ ප්‍රධාන ලෙසම සඳහන් වන්නේ තේසවලාමෙයි නමින් හැඳින්වූ මේ නීති- රීති, චාරිත්‍ර - වාරිත්‍ර පිළිබඳවයි. මේ වාර්තාව ලන්දේසි අණ දෙන නිලධාරි වැන්ඩර් ඩුයෙන් ගේ නියෝගයෙන් දෙමළ භාෂාවට පරිවර්තනය වී යාපනයේ මුදලියාර්වරුන් අතරේ බෙදා දෙන ලදි. ඒ මුදලියාර්වරුන් එහි සඳහන් වූ කරුණු සමඟ එකඟ වූ හෙයින් 1708 වසරේ දී ලන්දේසී ආණ්ඩුකාර කොරනේලිස් ජෝන් සයිමන් ඒ සියල්ල යාපනයට අදාළ තේසවාලමේ නීතිය ලෙස නීතිගත කළේය.

තේසවලාමේ නීතියේ ප්‍රධාන කොටස් 2කි. ඉන් පළමු කොටස යාපන ප්‍රදේශයේ මලබාර් පදිංචි කරුවන් ගේ පුද්ගල නීති සම්බන්ධයෙනි. දෙවැන්න, යාපන ප්‍රදේශයේ ඉඩම් සම්බන්දයෙනි.[8] මේ නීති පද්ධතිය හඳුන්වා දීමෙන් ලන්දේසීන් බලාපොරොත්තු වූයේ මලබාර් වැසියන් සිය මුල් පදිංචි බිම් වලදී භුක්ති විඳි වරප්‍රසාද ඔවුන්ට හිමි කර දීමත්, යාපනයේ ඉඩම් අයිතිය ඔවුන්ට ලබා දීමත්ය. එනම් අවසාන වශයෙන් මලබාර්වරු නැවතත් සිය මුල් බිම් කරා යෑම වැළැක්වීමයි. මේ තේසවලාමේ නීති අද පවා දකුණු ඉන්දියාවේ මලබාරයේ මරුමකත්‍යන් නීති සමඟ ඉතා සමීප සමානකමක් පෙන්වයි. තේසවලාමේ නීතියට පෙරවදනක් සපයන ක්ලාස් අයිසාක්ස් පවසන්නේ මලබාර් වැසියන් ගේ සිවිල් නඩු විභාග කටයුතු සඳහා මේ නීති සංග්‍රහය යොදා ගත හැකි බවයි. මලබාර්වරු යනු කවුරුද යන ප්‍රශ්නය පසු කාලීන නීති කටයුතුවලදී පැන නැගිණි.

ඒ අනුව මලබාරය යනු බටහිර ඉන්දීය වෙරළබඩ ට්‍රැවන්කොර් ප්‍රදේශය ලෙසත් මලබාර්වරුන් යනු ඒ ප්‍රදේශයේ සිට පැමිණි අය ලෙසත් අර්ථ දක්වනු ලැබිණි.[9] මලබාර්වරුන් දෙමළ ජන කොටසක් වුවද ඔවුන් ගේ භාෂාවට මලයාම් බලපෑමක් තිබුණි. ලන්දේසිවරු මලබාර්වරුන්ට අමතරව දකුණු ඉන්දියාවේ තවත් පිරිසක් යාපනයට ගෙන ආහ. ඒ දකුණු ඉන්දියාවේ නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය වූ කොරමැණ්ඩල් වෙරළිනි. රෙදි විවීම, සායම් පෙවීම වැනි කර්මාන්ත ඔවුහු යොදා ගනු ලැබුණහ. මේ ආකාරයට දකුණු ඉන්දිය ශ්‍රමිකයන් යාපනයට රැගෙන විත් ඔවුන් එහි ස්ථිර ලෙස පදිංචි කරවීම නිසා යාපනය ජන සංයුතියේ ප්‍රබල වෙනසක් සිදු විය. එපමණක් නොව ලන්දේසීන් අනුගමනය කළ ක්‍රියා මාර්ගය මේ රටේ ඉතිහාසයේ පළමු මග පෑදීය.

මේ ආකාරයට මලබාර් සහ කොරමැණ්ඩල් වෙරළබඩ ප්‍රදේශවලින් දෙමල ජනතාව රැගෙන ඒමට පෙර යාපනයේ සිටියේ සිංහලයන්, ආර්යචක්‍රවර්ති පවුලෙන් පැවත එන පිරිසක් සහ දෙමළ- කේරළ- වඩුග කුලී සේවකයන්/හමුදාවෙන් එහි පදිංචි වූ පිරිසකි. ලන්දේසීන්ගේ පූර්ණ අනුග්‍රහය දකුණු ඉන්දීය දෙමළ ශ්‍රමිකයන්ට ලැබීම නිසා මේ පිරිසට තව දුරටත් තම අනන්‍යතාව රැකගත නොහැකි විය. පරම්පරා දෙක තුනක් යන විට දකුණු ඉන්දියාවේ සිට පැමිණි දෙමළ ජනතාව ගේ සංස්කෘතියට අවශෝෂණය වූහ. ඒ අවශෝෂණය සිදු වූයේ විවිධ කුල ලෙසයි.

මේ අනුව ක්‍රි.ව. 18 වන සියවස මැද භාගයේ පමණ සිට යාපනයේ ප්‍රධාන ජන කොටස දෙමළ විය. මලබාර් වගා ශ්‍රමිතයෝ දෙමළ වෙල්ලාල කුලයට අයත් වූහ. එහි සිටි සිංහලයෝ කෝවියර් නම් කුලය ලෙස සංවිධානය වූහ. කෝවියර් නම් කුලයක් දකුණු ඉන්දියාවේ දෙමළ ජනතාව අතර නොවීමෙන් මේ කරුණ තව දුරටත් සනාථ වේ. ආර්යචක්‍රවර්ති පරපුරට අයත් පිරිස දෙමළ බ්‍රහ්මණයන් ලෙස යාපනයේ දෙමළ සමාජයට අවශෝෂණය වූහ. පුවිරාජසිංහ යනු එවැනි ප්‍රකට පවුලකි. මලධාර්වරුන් පැමිණීමට පෙර සිටි දෙමළ- කේරළ-



වඩුග කුලී හමුදාවෙන් පැවත එන්නන් සහ කොරමැණ්ඩල් වෙරළින් විවිධ කර්මාන්ත සඳහා පැමිණි පිරිස මඩප්පුලි, නලවර්, පල්ලර්, තට්ටර්, කොල්ලර්, තච්චර්, චිර්පාචාරි, වන්නාරි, අම්පට්ටර් ආදි කුල ඔස්සේ දෙමළ සමාජයට එක්වූහ. මේ අතරින් නලවර්, පල්ලර් ආදි කුලවලට අයත් වුවන් ගේ කාර්යය වූයේ වගා කටයුතු සඳහා වෙල්ලාලයන්ට සේවා සැපයීමයි. ඔවුහු අදුමායි ලෙස පොදුවේ හඳුන්වනු ලබති. වෙල්ලාල කුලයේ අය ගේ ඉඩම් වල විශේෂයෙන් වෙන් කළ ප්‍රදේශයක ඔවුන් ජීවත් විය යුතුය. ඔවුන් ස්පර්ශයෙන් උසස් කුල කිලිටි වේ යැයි සලකනු ලැබීය. ආර්යචක්‍රවර්තිවරුන් යටතේ බදු එකතු කිරීමට යාපනයට පැමිණි පිරිස මඩප්පුලි කුලයට අයත් වූහ. තමන්ට අතීතයේ දී හිමි වූ ආකාරයේ වැදගත්කමක් ලන්දේසි පාලනය යටතේ ද ලබා දෙන ලෙස මඩපුලිවරු ඉල්ලා සිටියහ. මේ අනුව ලන්දේසින් යටතේ වෙල්ලාල කුලයට ප්‍රධාන තනතුරු ලැබුණු බොහෝ විට එහි දෙවැනි ස්ථානය මඩප්පුලිවරුන්ට හිමි විය. තට්ටර් (රන් කරුවන්), කොල්ලර් (කම්මල්කරුවන්), තච්චර් (වඩුවන්), චිර්පාචාරී (කැටයම්කරුවන්), වන්නාර් (රජක), අම්පට්ටර් (කරණවෑමි), පරියාර් (බෙරකරුවන්) ආදීහු පොදුවේ 'කුදිමක්කල්' ලෙස හඳුන්වනු ලබති.

දකුණු ඉන්දියානු දෙමළ වෙල්ලාල වගා ශ්‍රමිකයන් යාපනයට රැගෙන විත් ඔවුන්ට ඉඩම් අයිතිය ලබා දුන් ලන්දේසීන් ඉන් බලාපොරොත්තු වූයේ ආර්ථික වාසි ලැබීම පමණක් නොවේ. වෙල්ලාල වගා ශ්‍රමිකයන්ට ඉඩම් අයිතිය පැවරුවද ඒ ඉඩම්වල සැබෑ හිමිකරුවා වූයේ සිංහල රජතුමා ය. කවර මොහොතක හෝ යාපනය තමන්ට අහිමි වේ යැයි බියකින් පසු වූ ලන්දේසින් ගේ උපක්‍රමය වූයේ තමන් රැගෙන ආ දෙමළ ශ්‍රමිකයන්ට ව්‍යාජ ඉතිහාසයක් නිර්මාණය කර දී යාපනය ඔවුන් ගේ බව ඒත්තු ගන්වා සිංහල රජුගෙන් එල්ල විය හැකි අභියෝග මඟ හරවා ගැනීමයි. ඒ අනුව 1736 වසරේ දී එවකට යාපනය භාරව සිටි ලන්දේසි ප්‍රධානියා වූ ජෑන් මැකාරා ගේ ආරාධනයෙන් මයිල්වාගනම් පුලවර් නමැත්තෙක් ව්‍යාජ ඉතිහාස කෘතියක් රචනා කළේය. එවකට තමන්ට අසන්නට ලැබුණු ඇතැම්

ඉතිහාස කරුනු ද ඇතුළත් කර මයිල්වාගනම් පුලවර් ලියූ ඒ කෘතිය යාල්පාන වෛපවමාලෙයි නමින් හැඳින්වෙයි.[10] එහි සඳහන් වන කරුණු එකිනෙකට අතිශයින් පරස්පරය. වෙනත් වංශකතාවලින් හෙළි වන තොරතුරු, පුරාවිද්‍යාත්මක සාධක සමඟ යාල්පාන වෛපවමාලෙයි කෘතියේ කිසිදු සංගත බවක් නැත. එය හුදුණී ජෑන් මැකරා පිනවීමට ලියූ ව්‍යාජ අංසගත කතන්දරයක් පමණි. එහෙත් පසු කාලීන දෙමළ ජාතිවාදී උගත්හු මේ කෘතියේ සඳහන් තොරතුරු මහත් සම්භාවනාවට පාත්‍ර කර ව්‍යාජ දෙමළ නිජ බිමක් තහවුරු කිරීමට ඒවා යොදා ගත්හ. යාල්පාන වෛපවමාලෙයි කෘතියෙන් යම් තරමක හෝ වැදගත්කමක් ඇතිනම් ඒ, තත් කෘතිය ලියැවුණු කාලයේ යාපන ප්‍රදේශයේ පැවති තත්වය පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමට පමණය. එයට පෙර කාලය ගැන එහි සඳහන් වන කරුණු කිසිදු වැදගත්කමකින් තොරය. ලන්දේසීන්ට පසුව යාපන ප්‍රදේශයේ බලය හිමි කරගත් ඉංග්‍රීසිහුද මයිල්වාගනම් පුලවර් ලිය ව්‍යාජ ඉතිහාසය තව දුරටත් ඉදිරියට ගෙන යෑමට අනුග්‍රහය දැක්වූහ. සයිමන් කාසිචෙට්ටි 1834 දී ලියූ *Ceylon Gazetter*, එස්.ජෝන් 1878 දී ලියූ යාල්පාන චරිත්තිරම්, වී. සදාසිවපිල්ලේ 1884 දී ලියූ යාල්පාන වෛපවම් එහි ප්‍රතිඵලය. මේ සෑම පොතක්ම මයිල්වාගනම් ගේ ව්‍යාජ ඉතිහාසය මත පදනම් විය.

මේ රටේ දෙමළ ජනතාව සියවස් ගණනාවක් පුරා දිව යන අනන්‍ය අඛණ්ඩ සංස්කෘතියක් ගොඩ නැඟුවා නම් ඔවුන් විසින් ලියන ලද පොත- පත තිබිය යුතුය. වෙනත් කලා කෘති තිබිය යුතුය. එහෙත් චෝළ ආක්‍රමණිකයන් ගේ කාලයේ ඉදි කළ ශිව දේවාල කිහිපයක් හා තවත් නිර්මාණ කිහිපයක් හැරුණු විට දෙමළ ජනයා ගොඩ නැඟූ ඓතිහාසික වැදගත්කමක් ඇති කිසිදු ගොඩනැගිල්ලක්, නිර්මාණයක් මේ රටේ නැත. දෙමළ භාෂාවෙන් ලියැවී ඇති පොත්පත් කිහිපය ද දෙමළ ජන කොටසක ගේ අවශ්‍යතා උදෙසා ලියැවුණු ඒවාය. දෙමළ භාෂාවෙන් මේ රටේ දී ලියැවුණු පළමු කෘතිය ලෙස සැලකෙන්නේ යාපනයේ ආර්යචක්‍රවර්ති ප්‍රධානියෙකුගේ අවශ්‍යතාවක් උදෙසා ලියැවුණු සේගරාසසේකරමාලෙයි නම්



ජ්‍යොතිෂ කරුනු අඩංගු කෘතියයි. II වන රාජසිංහ රජු දවස ලියැවිණැ යි සැලකිය හැකි දෙමළ අක්ෂරවලින් ලියැවුණු තඹ තහඩු දෙකක් සමන්තුරේ ප්‍රදේශයෙන් හමු වී ඇත. එහි සඳහන් වන්නේ දෙමළ ජන කොටසක් පිළිබඳව නොව සෙංකඩගල රාජසිංහ රජු රාමනාදර් නම් බ්‍රාහ්මණයකුට කළ පූජාවක් පිළිබඳවයි.

ලන්දේසීන් යාපනයට හඳුන්වා දුන් දුම්කොළ වගාව අතිශයින් සාර්ථක විය. ලන්දේසින් පමණක් නොව පසුව පැමිණි ඉංග්‍රීසිහුද ඉන් විශාල ලාබයක් ඉපැයූහ. මේ පිළිබඳව අගනා විස්තරයක් 1910 වසරේ මාර්තු මාසයේ යාපනයේ දුම්කොළ වගාකරුවන් පිරිසක්, එ වකට ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුකාර හෙන්රි මැකලම්ට යැවූ ලිපියක සඳහන් වේ.[11] ඒ අනුව ගත වූ සියවස් දෙක තුළ යාපනයේ පදිංචි කරුවන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය වී ඇත්තේ දුම්කොළ වගාවයි. ඒ ලිපියේ සඳහන් වන පරිදි එවකට යාපනයේ ජනගහනයෙන් බහුතරය දුම්කොළ කර්මාන්තය මත යැපුණු අය වෙති. 1905 වර්ෂය වන විට යාපනයේ පමණක් දුම්කොළ වගා කළ මුළු භූමි ප්‍රමාණය අක්කර 6880 කි. යාපන ප්‍රදේශය භාර ඉංග්‍රීසි නිලධාරියකු වු ආර්.ඩබ්.අයිවර්ස් 1898 වසරේ දී සැපයූ පරිපාලන වාර්තාවේ සඳහන් වන්නේ දුම්කොළ වගාව උතුරු පළාතේ කොඳු නාරටිය ලෙස සැලකිය යුතු බවත්, එය දියුණු කිරීම සඳහා පියවර ගැනීම වෙනත් කවර පරිපාලනමය හෝ ව්‍යවස්ථාදායක හෝ තීන්දුවකට වුවද වඩා වැදගත් බවත්ය.[12]

ලන්දේසින් යටතේ යාපනයේ වගා කළ දුම්කොළ සඳහා ප්‍රධාන වෙළඳපොළ වූයේ ට්රැවන්කෝරයයි. ට්රැවන්කෝර් වැසියන් යාපනයේ දුම්කොළ සඳහා කෙතරම් පුරුදු වී සිටියාද යත්, ඒ සඳහා කොතරම් රුචියක් දැක්වුවාද යත්, පසු කාලීනව ඉංග්‍රීසින් කොයිම්බතූර්හි වගා කළ දුම්කොළ අඩු මිලට ට්රැවන්කෝරයට හඳුන්වා දුන්නද එහි වැසියන් කොයිම්බතූර් දුම්කොළ වලට වඩා දෙගුණයක මිලක් ගෙවා යාපනයේ දුම්කොළ මිලදී ගත් බව පැවසේ.[13] ට්රැවන්කෝර් වැසියන්ට ගැළපෙන පරිදි දුම්කොළ මුහුදු වතුරේ පොඟවා විශේෂ ලෙස

සකස් කිරිමේ දැනුමක් යාපනයේ දුම්කොළ වගාකරුවන් සතු විය. එයට හේතුව අනෙකක් නොව යාපනයේ දුම්කොළ වගාකරුවන්ද ට්රැවන්කොරයේ සිට මෙහි පැමිණි අය වීමයි. තම මුල් බිම් වල සිටි ජනයා ගේ රුචිකත්වය ගැන ඔවුහු හොඳින් දැන සිටියහ.

පෘතුගීසින් පලවා හැර යාපනයේ බලය තහවුරු කරගත් ලන්දේසීහු දුම්කොළ වගාවෙන් විශාල ලාභ ලැබුව ද භූමියේ අයිතියක් නොවීම පිළිබඳ පසුතැවිල්ලෙන් පසු වූහ. භූමියේ අයිතිය තිබුණේ සෙංකඩගල රජු අතයි. ලන්දේසීන්ට බලය හිමි වූ රටේ වෙනත් ප්‍රදේශවල තත්වය ද එසේ ම විය. මේ නිසා සුපුරුදු පරිදී ගිවිසුමක් මගින් සිංහලයන් රවටා භූමියට අයිතියක් ලබා ගැනීම ලන්දේසි උපාය විය. ලන්දේසි සාර්ථක වූ අතර 1766 වසරේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමඟ ගිවිසුමක් ඇති කර ගැනීමට ලන්දේසිහු සමත් වූහ. ඒ ගිවිසුමට අනුව, ''යාපා පට්ටනම හා ඊට අඩුත්තු රටවල් ද බටහිරින් කම්මලේ සිට යාපා පට්ටනම දක්වාත්, නැගෙනහිරින් යාපා පට්ටනමේ සිට වලවේ ගඟ දක්වාත් මුහුදේ සිට රට මැදට සිංහල ගව්වක දුර ප්‍රමාණයක අයිතිය''[14] ලන්දේසීන්ට පවරා දෙනු ලැබිණි. මේ අනුව ක්‍රි.ව. 1766 වන තුරුත් යාපනය, ඒ ආසන්න දූපත් සහ නැගෙනහිර පළාත සිංහල රජු යටතේ පැවති බව කිසිදු සැකයකින් තොරව සනාථ වේ. කෙසේ වෙතත් කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසින් සමඟ මේ ගිවිසුම අත්සන් කළේ කිසිදු කැමැත්තකින් නොවන බව පැවසේ.

දෙවන රාංසිංහ රජු පෘතුගීසීන් පලවා හැරීමට ලන්දේසීන් ගේ සහය පැතූ ආකාරයට කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසීන් පලවා හැරීමට ඉංග්‍රීසි සහය ලබා ගැනීම කෙරෙහි උනන්දුවක් දක්වීය. ඒ අනුව 1762 වසරේ දී ජෝන් ෆයිබස් ප්‍රමුඛ ඉංග්‍රීසි දූත පිරිසක් කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමු විය. ඒ දූත ගමන අසාර්ථක වුවද 1782 දී හියු බොයිඩ් ගේ නායකත්වයෙන් පැමිණි ඉංග්‍රීසි ජාතිකයන් පිරිසක් සිංහල රජු සමඟ එකඟතාවකට පැමිණීමට සමත් වූහ. පෘතුගීසීන්ට ලන්දේසීන්ට වඩා සටකපට පිරිසක් වූ ඉංග්‍රීසිහු ලන්දේසීන්ට බලය හිමි වූ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ



පමණක් නොව අවසානයේ මුළු රටම සියතට ගැනීමට සමත් වූහ. ක්‍රි.ව. 1796 පෙබරවාරියේ දී ලංකාවේ තම බලය පැතිර පැවති සියලු ප්‍රදේශ ඉංග්‍රීසි පෙරදිග සහ ඉන්දීය වෙළඳ සමාගමට පවරාදෙන ගිවිසුමකට එවකට බාරව සිටි ලන්දේසි ආණ්ඩුකාරයා ෆන් එංගල්බෙක් අත්සන් තැබීය. ඒ අනුව යාපන අර්ධද්වීපයේ පාලන බලය ද ඉංග්‍රීසින්ට හිමි විය. ක්‍රි.ව. 18 වන සියවස අග භාගයවන විට ලන්දේසි අනුග්‍රහය යටතේ යාපන ජනගහනය ප්‍රධාන ලෙසම දෙමළ ජන වර්ගයට අයත් පිරිසෙන් සැදුම් ලද්දේ වුවද ඔවුහු තව දුරටත් විදේශිකයන් ලෙස සැලකුණහ. 1805 වසරේදි *An Account of the Isaland of Ceylon* නම් පොතක් ලියූ රොබට් පර්සිවල් කපිතාන්වරයා දෙමළ ජනතාව හඳුන්වා ඇත්තේ විදේශිකයන් ලෙසයි. විදේශීය දෙමළ ජන සංඛ්‍යාව දේශීය ජනගහනයට වඩා බෙහෙවින් වැඩි බව ඔහු පවසයි. යාපනයේ ඉතිරිව සිටි සිංහලයන් කෝවියර් කුලය ඔස්සේ දෙමළ සංස්කෘතියට අවශෝෂණය වෙමින් පැවතියද තව දුරටත් ඔවුන් යාපනයේ මුල් පදිංචිකරුවන් ලෙස හඳුනාගැනීමට කපිතාන්වරයාට හැකි වන්නට ඇත.

මලබාරයෙන් යාපනයට ගෙන ආ වෙල්ලාල වගා ශ්‍රමිකයන්ට සුවිශේෂ වරප්‍රසාද ලබා දීමට ලන්දේසීන් ගත් ප්‍රතිපත්තිමය තීරණය ඉංග්‍රීසිහු තවදුරටත් ඉදිරියට රැගෙන ගියහ. ලන්දේසීන් එවැන්නක් බලාපොරොත්තු වූයේ යාපනය ප්‍රදේශයේ සිය බලය තහවුරු කර ගැනීම වුවද ඉංග්‍රීසීහු එය ඉක්මවා මුළු රටේ ම තම බලය තහවුරු කර ගැනීමට යාපනයේ දෙමළ ජනතාව යොදාගත්හ. සිංහලයන්ගෙන් තමන්ට එල්ල වන අභියෝග ජය ගැනීමට ඉංග්‍රීසිහු යාපනයේ දෙමළ ජනතාව මැනවින් කළමණාකරණය කළහ. 1833 වසරේ දී ඉංග්‍රීසීන් ඇති කළ ව්‍යවස්ථාදායක මණ්ඩලයට නිලනොලත් මන්ත්‍රීවරු පත් කිරීමේදී ඒ වන විට වසර 130 - 140 ක පමණ ඉතිහාසයක් තිබුණු රටේ ජනගහනයෙන් 4% ක් පමණ වූ යාපනයේ දෙමළ ජනතාවටත් වසර 2200 ක ඉතිහාසයකට උරුමකම් කී රටේ ජනගහනයෙන් අති බහුතරය වූ සිංහල ජනතාවටත් එක් නියෝජිතයකු බැගින් ලබා දීමෙන් ඉංග්‍රීසින්ගේ මේ අසාධාරණ ක්‍රියා කලාපය මැනවින් පැහැදිලි වේ.

ඉංග්‍රීසි ආක්‍රමණිකයන් ඇඟිලි ගසන විට මේ රටේ දෙමළ ජනගහනය ප්‍රධාන ලෙසම ඒකරාශි වී සිටියේ යාපනය අර්ධද්වීපයටය. එහෙත් ඉංග්‍රීසීන් රට හැර යන විට යාපනයට අමතරව රටේ නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශයේ ද මධ්‍යම කඳුකරයේද සැලකිය යුතු දෙමළ ජනගහණයක් විය. නැගෙනහිර වෙරළබඩ තීරයේ දෙමළ ජනතාව ගේ ඉතිහාසය ඇරඹෙන්නේ 1850-1860 කාලයේදීය. මහාමාර්ග ඉදි කිරීමට හා වෙනත් කටයුතු සඳහා එමර්සන්ට් ටෙනන්ට් යටත් විජිත ලේකම්වරයාගේ කාලයේ දී මෙරටට ගෙන ආ දෙමළ කම්කරුවන් නැගෙනහිර වෙරළබඩ තීරයේ පදිංචි කිරිමෙන් නැගෙනහිර දෙමළ ජනගහනය ඇරඹිණි. ඒ වන විටත් සෙනරත් රජු විසින් පදිංචි කරවන ලද වූ මුස්ලිම් ජනතාව නැගෙනහිර වෙරළබඩ තීරයේ තැනින් තැන ජීවත් වූහ. එමර්සන්ට් ටෙනන්ට් දෙමළ කම්කරුවන් පදිංචි කරවන්නේ මුස්ලිම් ජනතාව වාසය නොකළ වෙරළබඩ ප්‍රදේශවලය. ටෙනන්ට් 1848 වසරේ දී මඩකලපුවේ සංචාරය කරන විට එහි දෙමළ ජනගහනයක් නොවූ බව දක්වා ඇත.[15]

මධ්‍යම කඳුකරය ආශ්‍රිත ව දෙමළ ජනගහනයක් ඇති වීමට හේතු වන්නේ කෝපි සහ තේ වගාව සඳහා මෙරටට රැගෙන ආ දකුණු ඉන්දීය ශ්‍රමිකයන් ඉංග්‍රීසීන් විසින් ඒ ප්‍රදේශවල පදිංචි කර වීමයි. උඩරට දෙමළ ජනයා ගේ දේශපාලන, ආර්ථික, සංස්කෘතික අනන්‍යතාව යාපනයේ සහ නැගෙනහිර දෙමළ ජනයාගෙන් වෙනස් එකකි. ඒ අයුරින්ම යාපනයේ සහ නැගෙනහිර දෙමළ ජනතාවගේ අනන්‍යතා ද එකි නෙකට වෙනස් ය. එ පරිදි මේ රටේ යාපනය, නැගෙනහිර සහ උඩරට ලෙස වෙනස් අනන්‍යතා ඇති දෙමළ ජන කොටස් 3ක් ජීවත් වෙති.

අද අනුරාධපුරය, වව්නායාව, පුත්තලම වැනි දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශ නාම සහ වැව්වල නාම දෙමළ ඌරුවක් ගෙන තිබෙනු ගෙන තිබෙනු දක්නට ඇත. මේ කරුණ නිසා ඒ ප්‍රදේශවල දෙමළ ජනගහනයක් සිටි බවට වැරදි අදහසක් ඇතැමුන් තුළ ඇත. මේ රටේ සියලුම ප්‍රදේශ නාම සහ වැව්වල



නාම යෙදුණේ සිංහලයෙනි යාපනයේ, නැගෙනහිර පළාතේ සහ උඩරට ඇතැම් ප්‍රදේශවල, ප්‍රදේශ නාම දෙමළ හුරුවක් ගන්නේ ඒ ප්‍රදේශ හැඳින්වීමට භාවිත කළ සිංහල නම් පසුව පදිංචි වූ දෙමළ ජනයා දෙමළට පරිවර්තනය කර ගැනීම හෝ භාවිත වූ සිංහල නම දෙමළ හුරුවට හරවා ගැනීම හෝ නිසාය. අනුරාධපුරය, වව්නියාවණි පුත්තලම දිස්ත්‍රික්කවල දෙමළ වචන හෝ දෙමළ ඌරුවක් ඇති වචන හෝ ප්‍රදේශ, වැව් හැඳින්වීමට යොදා ගැනීමට හේතුව ඉංග්‍රීසීන් විසින් මේ ප්‍රදේශ සිතියම් ගත කරද්දී මිනින්දෝරු සහායකයන් ලෙස සේවය කළ දෙමළ නිලධාරීන් ඒ ප්‍රදේශ හැඳින්වූ සිංහල නම් දෙමළ බවට පත් කිරීමයි. ඉංග්‍රීසීන් ලබා දුන් සුවිශේෂී වරප්‍රසාද වලට හිමිකම් කී යාපනයේ දෙමළ උගත්හු ඉංග්‍රීසි පරිපාලනය මඟින් බොහෝ රැකියා අවස්ථා ලබා ගැනීමට තරමේ භාග්‍යවන්තයෝ වූහ. ඉංග්‍රීසීන් මේ රට තුළ ඇරඹූ මුල්ම දෙපාර්තමේන්තුවක් වන මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ද ආරම්භයේ සිට ම යාපනයේ දෙමළ ජනයාට සුවිශේෂ අවස්ථා හිමි විය.

## පාදක සටහන්

1. පීරිස්, පී.ඊ., ලංකාව පෘතුගීසි යුගය, කාණ්ඩ 1, අභය හේවාවසමේ පරි., සූරිය ප්‍රකාශකයෝ, 2008, 297 පි.
2. අබයසිංහ, ටිකිරිබණ්ඩා හේරත්, පෘතුගීසීන් හා ලංකාව, දෙවන මුද්‍රණය, ස්ටැම්ෆර්ඩ්ලේක්, පන්නිපිටිය, 2006, 8-9 පි.
3. -එම, 85 පි.
4. -එම, 86 පි.
5. -එම, 100 පි.
6. පද්මප්‍රිය, කමල්, යාපනයේ සිංහල බෞද්ධ උරුමය සහ දෙමළ නිජභූමි මිථ්‍යාව, සරසවි සංවාද කේන්ද්‍රය, පේරාදේණිය සරසවිය, 2003, 22 පි.

07. Sri Ramanathan ,Tesawalamai - The Lows and Customs of the Inhabitants of the Province of Jaffna, Nadaraja Limited, Colombo, 1962, pp 3-4,
08. Ibid, p.7.
09. Ibid, p.8.

10. ද සිල්වා, කේ.එච්., යාපා පටුනේ වංශකථාව, යාල්පානම් වෛපවමාලෙයි, සිංහල පරි, සමන් ප්‍රකාශන, 1956.

11. Papers relating to the Indian Tobacco Duty and the Jaffna Travancore Tobacco Trade, Government Printer, Ceylon, 1910, pp1117 -1120.

12. "I would again add that tobacco is the backbone of the Northern Province and the improvement of it 's Cultivation is more important than any administrative or legislative measures" - Mr. R.W.Ivers, Administration Report for the Northern Province, 1898.

13. "There was a time when the Jaffna tobacco was the only tobacco consumed in Travancore. Though latterly The Coimbatore tobacco began to compete with Jaffna tobacco is a necessary of the life, Preferred the jaffna tobacco in the market, yet the people of Travancore, To whom tobacco is a necessary of the Price of the Coimbatore tobacco, and paid for it almost double the Price of the Coimbatore tobacco, and thus continued to encourage the Jaffna tobacco trade"

14. JCBRAS ,Vol .xvi,p.62 .

15 Tennent, J.E., Ceylon, an Account of the Island, Physical, Historical and Topographical, 2 nd edi, Vol ii, Asian Education Services, Madras, 1999, p. 458.